# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 876 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.06.14, පැය 1410

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**වෙඩි තැබීමකින් පුද්ගලයෙකු මිය යාම - වත්තල පොලිස් වසම**

2022.06.14 වන අද දින දහවල් වත්තල පොලිස් වසමේ ඇලකන්ද, හැඳල මාර්ගයේදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් සිදු කල වෙඩි තැබීමකින් පුද්ගලයෙකු තුවාල ලබා රාගම රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට වත්තල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 23ක්වූ අලිවත්ත, මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවකු බවට දැනට ලද තොරතුරු මත අනාවරණය වී ඇත.**

වෙඩි තැබූ ස්ථානයේ තිබී ටී 56 ගිනි අවි සඳහා භාවිතා කරනු ලබන පතරොම් කිහිපයක් හමු වී ඇති අතර, ඒ අනුව මෙම වෙඩි තැබීම සඳහා ටී 56 අවියක් භාවිතා කර ඇති බවට හා සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අතර මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධව ඇති වූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙය සිදුව ඇති බවට පොලිසිය සැක කරනු ලබයි.

මෘත ශරීරය පශ්චාත් මරණය පරීක්ෂණය සඳහා රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කැළණිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ පොලිස් කණ්ඩායම් කිහිපයක් විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**